www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා හිස් අතින් ම බුරුමයෙන් නික්මෙයි

## UN special envoy leaves Burma empty-handed

**සුජීව අමරනාත් හා සරත් කුමාර විසිනි**
**2007 ඔක්තෝබර් 04**

එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ඊබ්‍රහිම් ගම්බාරී මිලිටරි ජුන්ටාවෙන් ලැබෙන සහනයක කිසිදු සලකුනුකුදු නොමැතිව ම අඟහරුවාදා බුරුමයෙන් (මියන්මාරයෙන්) පිට විය. රැන්ගුන් හා මැන්ඩලේ නගර, විශාල ගනනක් හමුදා භටයින් මාර්ගවල රැකවල් ලා ගත්වනම, තවමත් සම්පූර්නයෙන්ම හදිසි නීතියට යටත්ව ඇත. දැඩි මාධ්‍ය වාරනයක් පනවා ඇති අතරම, විරුද්ධ පක්ෂ ක්‍රියාකාරින්ව රාත්‍රී කාලයේ දී අත් අඩංගුවට ගැනීම් තව දුරටත් ක්‍රියාත්මක වන බව පෙනේ.

දහස් ගනනින් නොවේ නම් සිය ගනනින්, රැඳවුම්කරුවන්, පැරනි කර්මාන්තශාලා, තාක්ෂන විද්‍යාල ගොඩනැගිලි හා ධාවන පථයක්ද ඇතුලත් හදිසියේ අටවාගත් සිර කඳවුරුවල රඳවාගෙන ඇති බවට වන වාර්තාවන් බුරුමයෙන් පිටතට ලැබීමට පටන් ගෙන ඇත.

රඳවාගෙන සිට පසුව නිදහස් කල එක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජාතික නිලධාරියෙක්, තවත් 800ක් දෙනා ඉතා දුක්ඛදායක තත්වයන් යටතේ රැන්ගුන්හි විශ්වවිද්‍යාලයක් තුල රඳවාගෙන සිටින බව ඉන්ටර් නැෂනල් හෙරල්ඩ් ට්‍රිබියුන් පුවත්පතට ප්‍රකාශ කලේ ය.

දැඩි මිලිටරි ස්ථානගත කිරීම්, විරෝධතාවයන් සීමිත හා තැන තැන පැන නගින තත්වයට පත් කිරීමට වගබලාගෙන ඇත. ඉරිදා දිනයේ දී 800 ක පමන ජනකායක්, හමුදාව හා පොලීසිය එක්ව විසිරුවා හැරීමට පෙර "සියලු ම දේශපාලන සිරකරුවන් නිදහස් කරනු"යි ඝෝෂා කරමින් ටොන්ගොක් නගරය හරහා පෙලපාලි ගියහ. රැන්ගුන් වෙතින් ලැබෙන වීඩියෝ පටවල විරෝධතාකරුවන්ගේ කන්ඩායම් රැස් වනුත් ඒ සමග ම විසිරුවා හැරීමට පෙර සටන්පාඨ හඬ නගන අයුරුත් දක්නට ලැබී ඇත.

රැන්ගුන් වැසියන්, මිලිටරි ට්‍රක්රථ, ශබ්දවිකාශන යොදා ගනිමින් තර්ජන ගර්ජන කරමින් රාත්‍රී කාලයේ දී මාර්ගවල මුර සංචාරයේ යෙදුනු බැව් වාර්තා කර ඇත. සිර කර ගෙන සිටින මිනිසුන්ගේ ඇස්තමේන්තුව 1600ත් 6000ත් අතර ප්‍රමානයක ශිෂ්‍යයින්, පූජකයින්, මාධ්‍යවේදීන් හා විපක්ෂ නායයින් වෙත්. පසු ගිය සතියේ ගැටුම්වලින් මියගිය ප්‍රමානය නිල වසයෙන් 10ක් වුවත් විරුද්ධ පක්ෂ කන්ඩායම් එය 200ක් තරම් ඉහල ප්‍රමානයක් බවට තක්සේරු කරති.

සඳුදා දින එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීම අමතමින් බුරුමයේ විදේශ ඇමති යූ න්‍යාන් වින් "බෞද්ධ පූජකයින් සුලු පිරිසකගේ විරෝධතාවයක්" "නව යටත් විජිතවාදීන්" හා "දේශපාලන අවස්ථාවාදීන්" ඔහුගේ රටට වල කැපීමට අනිසි ලෙස යොදා ගන්නා බව පැවසී ය. ඔහු මිලිටරි කඩා පැනීම ආරක්ෂා කලේ, "තත්වය සමතයකට පත් කිරීමට පියවර ගැනීමට" ආරක්ෂක අංශයන්ට සිදු වූ බවත් ඒ සමග ම "ඉහල ම හික්මීමකින්" කටයුතු කල බවත් ප්‍රකාශ කර සිටියේ ය.

එක්සත් ජනපදයත් අනෙක් ප්‍රධාන බලවතුනුත් මෙම විරෝධතා ව්‍යාපාර ඔවුන්ගේ ම අවශ්‍යතාවන් සඳහා අනිසි අයුරින් යොදා ගත් බව නිශ්චිතව ම සත්‍යයකි. පසු ගිය සතියේ දී 100,000ක් දක්වා වර්ධනය වී තිබූ මේ විරෝධතා ව්‍යාපාරයන් කොහෙත්ම සුලු පරිමාන වූයේ වත් පූජකයින්ට සීමා වූයේ වත් නැත. අගෝස්තුවේ දී උසුලා ගත නොහැකි තරමේ මිල ඉහල දැමීමත් සමගින් එලි බැස ගත් මේ විරෝධතා ව්‍යාපාරය, ජුන්ටාවේ දූෂිත හා වරප්‍රසාදිත පැවැත්ම, එහි මර්දනකාරී පාලනය හා ජීවන කොන්දේසිවල සෑජු පිරිහීම කෙරෙහි කෝපයෙන් පසුවන ජනතාවගේ පුලුල් ස්තරයන් එතුලට ඇද ගත්තේ ය.

පසු ගිය සතියේ එක්සත් ජාතීන්ගේ නියෝජිත ගම්බාරී බුරුමය කරා පිටත් කර යැවීම වටා ඔහුට ජුන්ටාව හා විපක්ෂ නායකයින්, විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජාතික ලීගයේ (එන්එල්ඩී) අවුන් සාන් සූ කී අතර එකඟතාවයක් ඇති කිරීමට හැකි වේ යයි, සැලකිය යුතු ප්‍රමානයක මාධ්‍ය අනුමාන කරනයක් පැවැතුනි. සූ කී සමග වූ ඔහුගේ ආරම්භක සාකච්ඡාවේ සිට බුරුමයේ ඉහලම ජනරාල් වරයා වන තාන් ස්වේ හමුවීම ප්‍රමාද වීම දක්වා, ඒ සමග ම සූ කී සමග වූ ඔහුගේ අවසන් සාකච්ඡාවත් සියුම්ව පරීක්ෂාවට භාජන වී තිබුනි.

ඔහුගේම විස්තර කථනයන් තුලින් නිගමනය කලත්, ගම්බාරිගේ රාජ්‍යතාන්ත්‍රික සංචාරයේ ප්‍රතිඵලය අවම ප්‍රමාණයක පවතින බව පෙනෙන්නට ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බැං කී-මූන්, අපගේ නියෝජිතයා බුරුමයේ මිලිටරි නායකයින්ට "දියහැකි බලගතු ම නිවේදනය" දන්වා සිටි බවත් ඊයේ සඳහන් කලේ, එසේ මුත් දින හතරේ මෙම චාරිකාව 'සාර්ථකත්වයක්' ලෙස විස්තර කල නොහැකි ය" යි ඊට ම එකතු කලේ ය. ගම්බාරි, හෙට බුරුමයේ තත්වය සාකච්ඡා කිරීමට රැස්වන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

ජුන්ටාවත් විපක්ෂ කන්ඩායමුත් අතර " පිලිසඳරක්" ඇති කරලීම "සාර්ථක වූ" චාරිකාවක් වුවත්, බහුතරයක් බුරුම ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය හා ඉහල ජීවන තත්වයන් සඳහා වන ප්‍රාර්ථනා ලඟාකර ගැනීමට කිසිවක්ම නො කරනු ඇත. "එකඟතාවයක්" හෝ බලය බෙදා ගැනීමේ වැඩපිලිවෙලක් මිලිටරියට එහි පාලනය තහවුරු කර ගැනීමට අවකාශ ලබා දෙනු ඇති අතර, ඒ සමග ම විපක්ෂයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව ඉල්ලා සිටින කුප්‍රකට ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙල ක්‍රියාවට දැමීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනු ඇතිවාක් පමනි.

1988 දී, පුලුල්ව පැතිර ගිය වැඩ වර්ජන හා විරෝධතාවයන් මත මිලිටරිය කඩා පැනීමෙන් පසු එන්එල්ඩීය පාලන තන්ත්‍රයට සිය පන නල රැක ගැනුමට උපකාර කලේ ය. සූ කී "නිදහස් හා සාධාරන" මැතිවරනයක් සඳහා මිලිටරියේ පොරොන්දුව පිලිගෙන විරුද්ධ පක්ෂ ව්‍යාපාරය නවතා දැමී ය. එන්එල්ඩීය විශිෂ්ඨ ලෙස 1990 ඡන්දය ජය ගත්තේය. ඒ කෙසේ වුවත් ඒ වන විට පාලන තන්ත්‍රය එහි අධිකාරිය තහවුරු කර ගෙන තිබුනි. ජෙනරාල්වරුන් ඡන්ද ප්‍රතිඵල නොතකා හැර විරුද්ධ පක්ෂය නීති විරෝධී බවට පත් කලහ.

සූ කී හා විරුද්ධ පක්ෂය සඳහා වඩාත් ඉහල භූමිකාවක් වෙනුවෙන් වන එක්සත් ජාතීන්ගේ අලුත්ම තල්ලුව පිටුපස එක්සත් ජනපදයේ හා ඔවුන්ගේ යුරෝපීය සගයින්ගේ ඕනෑ එපාකම් පවතී. බුරුමය තුල "ප්‍රජාතන්ත්‍රවාදය" සඳහා බුෂ් පරිපාලනයේ ව්‍යාපාරය සාමාන්‍ය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිලිබඳ තැකීමකින් පැන නැග්ගා නම් නො වේ. එය එල්ල කර ඇත්තේ බුරුම ජුන්ටාව සමග සමීප ආර්ථික හා මූලෝපායික සබඳතා පවත්වාගෙන යන හතුරු චීනය කොන් කර දැමීමටත්, ඒ සමග ම බුරුමයේ ලාභ ශ්‍රමය හා සම්පත් ඇමරිකානු සංගතයන්ට විවෘත කර දීමටත් ය.

ලෝකයේ ස්වාභාවික වායු සංචිතයෙන් සියයට 1.4ක් එනම් ඝන මීටර ට්‍රිලියන 3කුත්, ඒ සමග ම තෙල් බැරල් බිලියන 3කුත් බුරුමය සතුව ඇතැයි තක්සේරු කර ඇත. එසේ ම බුරුමය දැව, මැනික් හා නිකල්, තඹ හා ගල් අඟුරු වැනි ඛනිජ ද ඇතුලත්ව වෙනත් සම්පත්වලින් ද ආඪ්‍ය වේ. චීනය, අර්බුදකාරී තත්වයකදී එක්සත් ජනපදය මගින් අහුරා ලිය හැකි මලක්කා සමුද්‍ර සන්ධිය වැනි අවහිර කිරීමට පහසු ස්ථානයන් මගහැර, ඉන්දියන් සාගරයටත් මැද පෙරදිගටත් විකල්ප ප්‍රවේශ මාර්ගයකට අවකාශ සලසන හෙයින් බුරුමය සමග මූලෝපායික සබඳතාවයකට විශේෂයෙන් ම උනන්දුවක් දක්වයි.

තවත් බොහෝ රටවල් ද බුරුමය තුල ස්ථානයක් තහවුරු කර ගැනීමට උපායෝපක්‍රම යොදයි. එක්සත් ජනපද පීඩනයට ප්‍රතිචාර දක්වමින්, චීනය " (බුරුමය) සම්බන්ධයෙන් සැලකිලිමත් සියලු පක්ෂයන්ට හික්මවා ලීමට" පරීක්ෂාකාරීව බල කල අතර වාර්තා වන ආකාරයට ගම්බාරිගේ චාරිකාවට ඉඩ සලසා දෙන ලෙස ජුන්ටාවට බල කර ඇත. එසේ කරත්දී ම, චීනය හා රුසියාව එක්සත් ජාතීන්ගේ කවුන්සිලය මගින් බුරුමය නිල වසයෙන් හෙලා දැකීමකට විරුද්ධ විය.

බුරුමය තුල තම අධිකාරය වැඩි දියුනු කිරීමට බලාපොරොත්තුව සිටින ඉන්දියාව පැහැදිලි ලෙස ම නිශ්ශබ්දතාවය රකිමින් සිටියි. සැප්තැම්බර් 23 දා, විරෝධතාවයන් තීව්‍ර වන තතු යටතේ, ඉන්දියාවේ ඛනිජ තෙල් හා ස්වාභාවික ගෑස් පිලිබඳ ඇමති මුර්ලි සිඩ්රා රජය යටතේ පාලනය වන ඕඑන්ජීසී විදේශ් ලිමිටඩ් හා බුරුම රජය අතර තෙල් හා ගෑස් සෙවීම සම්බන්ධ ගිවිසුම් අත්සන් කිරීම සඳහා බුරුමය වෙත රාජ්‍යතාන්ත්‍රික චාරිකාවක යෙදුනි. ඉන්දියාවේ ප්‍රතිපත්තිය ආරක්ෂා කරමින්, ඉන්දියාවේ හිටපු එක්සත් ජාතීන්ගේ තානාපති ටී.පී. ශ්‍රීනිවාසන් රෙඩිෆ් ඩොට් කොම් වෙබ් අඩවියට ලීවේ "(ඉන්දියාවට) මියන්මාරය තුල වෙනසක් ගෙන ඒමට සිද්ධීන්ගේ පසුතලයේ සිට නිහඬව වැඩ කිරීමට සිදුව ඇත. මෑත කාලීනව ඉන්දියාවේ ආරක්ෂාව තර කර ගැනීමට ලැබුනු සියලු දේ, විවෘත හෙලා දැකීමක් තුලින් නැති කර ගැනීමෙන් කිසිවකුට යහපතක් නොවනු ඇත."

තායිලන්ත මිලිටරි ජුන්ටාව, ගිනිකොන දිග ආසියානු ජාතීන්ගේ සංගමයේ (ආසියාන්) පුලුල් විවේචනයක කොටසක් ලෙස, ඔවුන්ගේ ම බුරුම ප්‍රතිමූර්තියේ මර්දනකාරී පිලිවෙත් කුහක අයුරින් හෙලා දුටුවේ ය. තායිලන්තය බුරුම පාලකයන්ට ඇති විශාලතම වෙලඳපොල ද, ස්වාභාවික ගෑස්වල ප්‍රධානතම ගැනුම්කරුවෙක් ද, ඒ සමග ම ලී, මැනික් හා අනෙකුත් අමුද්‍රව්‍යවල නීති විරෝධී වෙලඳම සඳහා ප්‍රනාලියක් ද වෙයි. සිංගප්පූරුව, ආසියාන් සංවිධානයේ වර්තමාන මුලසුන දරන්නා ලෙසින් බුරුමයට දෝශාරෝපනය කිරීමේ දී තියුනුව ඇත. මේ දූපත් රාජ්‍යය, ඒ කොයි හැටි වෙතත්, ජනරාල්වරුන්ට හා ඔවුන්ගේ පවුල්වලට ධනය බැංකුවල තැන්පත් කිරීමටත්, සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමටත්, සාප්පු

සවාරි හා ක්‍රීඩා සඳහාත් තෝතැන්නක්ව ඇතුවා සේ ම, ජුන්ටාව තුලට ආයෝජනයන් ගලා එන සැලකිය යුතු තරමේ උල්පතක්ව පවතී.

බුරුමයට එරෙහි සියලු ම සම්බාධක පිලිබඳ තර්ජනයන් මත්තෙහි දී ම, බුරුමයේ යඩානා ගෑස් බිම් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රන්ස ටෝටල් සමාගමේ හවුල්කරුවාව සිටි යුනෝකාල් වෙතින් එම අවස්ථාව ලබා ගත් එක්සත් ජනපද තෙල් සද්ධන්තයා වන චෙව්රොන් සමාගමේ පා ඇඟිලි නොපෑගීමට බුෂ් තන්ත්‍රය වග බලාගෙන ඇත. ටෝටල්, මැලේසියාවේ පෙට්‍රොනාස්, තායිලන්තයේ පීටීටී එක්ස්ප්ලොරේශන් ඇන්ඩ් ප්‍රඩක්ෂන්, දකුනු කොරියාවේ ඩේවූ ඉන්ටර්නැෂනල් හා චීනයේ රජය සතු සමාගම් දෙකක් - චයිනා නැෂනල් ඕෆ්ෂෝර් ඔයිල් කෝර්ප් හා චයිනා පෙට්රෝලියම් ඇන්ඩ් කෙමිකල්ස් කෝර්ප් - ද ඇතුලත්ව සංගතයන් නමයක් බුරුමය තුල සිය භූමියෙන් එපිට තෙල් සෙවීමේ ව්‍යාපෘතිවලට සම්මාදම් වී සිටී.

තමතමන්ගේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවයන් වැඩි දියුනු කර ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින ජාත්‍යන්තර හා කලාපීය බලවතුන්ගේ පුපුරන සුලු ආස්ථානයන් සමහන් කර ගැනීමට ගම්බාරිගේ රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුමට සිදු විය. ජුන්ටාවත් විරුද්ධ පක්ෂත් අතර සාකච්ඡා ඇරඹීම සම්බන්ධයෙන් සියල්ලෝ ම ගම්බාරි සමග එකඟ වීම ගත් කල එය එවැනි ම එකඟතාවයන් ඇතිවූ ප්‍රශ්න ඉතා සුලු ප්‍රමානයකින් එකක් වීම ඉතාමත් වැදගත් කාරනයකි. සියල්ලන් ම බිය වී සිටිනුයේ පාලක පන්තිය තුල ම හතුරු කන්ඩායම් අතර භේදය, කම්කරු පන්තියේ පුලුල් ස්තරයන්ට නැගී සිටීමට ඉඩකඩ සැලසෙන විවරයක් ඇති කරනු ඇතැයි කියා ය - 1988 දී කම්කරුවන්ගේ වැඩ වර්ජන මගින් ආර්ථිකය අඩපන කර ජෙනරාල්වරුන් දනගස්වාලූවාක් මෙනි.

බුරුමය තුල බල පවත්වන පොලිස්-රාජ්‍ය නීති ගත් විට කිසියම් ම හෝ ස්ථිරත්වයක් සහිතව මනෝගතීන් මැන ගැනීමට හැකි වන්නේ නැත. ඉහල යන මිල ගනන් හා රාජ්‍ය තන්ත්‍රයේ කෲරත්වය සම්බන්ධයෙන් මහ ජනතාවගේ පුලුල් ස්තරයන් අතර ඇති කෝපය පිලිබඳව සැක දැනවීමක් ඇත්තේ නම් නැත. රටේ සියලු ම සමාජ සංගනනයන්, ඉතා ම මූලික සෞඛ්‍ය හා සුභසාධන සේවාවන්ගේ හිඟය සමග බැඳුනු ඉතා ම දුක්ඛිත දුගීභාවය කෙරෙහි දෙස් දෙයි.

විරෝධතා ව්‍යාපාරයන් දැනට යට ගොස් පැවතීම කල් නොපවතින බවට ඇඟවුම් දක්නට ඇත. "විරෝධය දක්වන ආකාරය වෙනස් වනු ඇති දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් වෙනුවෙන් වැඩට බැසීමට මහජන ව්‍යාපාරයේ මෙහෙයුම් කමිටුව සූදානම් වෙමින් සිටී" යනුවෙන් ටුන් මින්ට් අයුන්, එක් ක්‍රියාකාරිකයෙක්, ඉරිදා දින *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පත්‍රයට ප්‍රකාශ කලේය. අනෙක් අය පුවත්පතට පැවසුවේ වඩා කුඩා නගරවල විරෝධතාවයන් සැලකිල්ලට භාජනය වෙමින් පවතින බවයි.

*ඒශියා ටයිම්ස්* ලිපියක් ද, ප්‍රමුඛ පෙලේ පූජකයින් හා ශිෂ්‍යයින් තව තවත් විරෝධතාවයන් දැක්වීම සඳහා නැවත කන්ඩායම් ගත වීමටත් නැවත සංවිධානය වීමටත් "වැඩ වර්ජන කමිටුවක්" පිහිටුවාගත් බව වාර්තා කලේ ය. "අපි ඒ සඳහා යන්නෙමු, මේ අපේ අවස්ථාවයි. කවදාවත් නැවත අවස්ථාවක් නොලැබීමට ද ඉඩ ඇති නිසා අප විසින් මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතුව ඇත" යි ශිෂ්‍ය නායකයෙක් *ඒශියා ටයිම්ස්* පුවත්පතට ප්‍රකාශ කලේ ය.

© www.wsws.org